# අව්‍ය පද

ව්‍යය, වය, විය, වැය යන පදවලින් හැඳින්වෙන්නේ වෙනස් වන යන අරුතයි. එලෙස වැය නොවන හෙවත් ක්ෂය නොවන ස්වභාවයෙන් යුතු පද අව්‍ය පද නම් වේ. ලිංග භේදය, විභක්ති භේදය, වචන භේදය හෝ කාල භේදය අනුව වෙනසකට ලක් නොවීම අව්‍ය පදවල ඇති විශේෂත්වයයි. එමෙන් ම අව්‍යය පද ලිංග හෝ වචන භේදයක් භජනය නොකෙරේ. අව්‍ය පද ඇසුරින් සිදුවන සමාස අව්‍ය 'සමස්' නම් වේ.

සංස්කෘත ව්‍යාකරණයෙහි අව්‍යය හඳුන්වා ඇත්තේ මෙලෙසිනි.

'සදෘශං ත්‍රිෂු ලිඞ්ගෙසු සර්වාෂු ච විභක්තිෂු,
වචනෙෂු ච සර්වෙෂු යන්නව්‍යෙති තදව්‍යයම්.'

තුන් ලිංගයන්හි ද සියලු විභක්තීන්හි ද සියලු වචනවල ද වෙනස්

නොවේ ද (වර නොනැඟේ ද) ඒ අව්‍යය නම්.

සිංහල ව්‍යාකරණ සම්ප්‍රදායයට අනුව 'අව්‍ය සද' හෙවත් අව්‍ය ශබ්ද කොටස් දෙකකි. එනම්,

1. නිපාත
2. උපසර්ග

යනුවෙනි.

## නිපාත

කිසියම් වාක්‍යයක මුල හෝ අග හෝ යෙදෙන නැතහොත් නාම හා ආඛ්‍යාත පද අතර වැටී අර්ථය ගෙන දෙන, විසිතුරු කරන හෝ වෙනස් කරන පද නිපාත නම් වේ. සිඳත් සඟරාවේ නිපාත හඳුන්වා ඇත්තේ 'ප්‍රකෘතියක් ඇසුරු කොට හෝ ඇසුරු නොකොට කරන ලද්දේ නිපාත' යනුවෙනි. කුමාරතුංග මුනිදස 'නාම හෝ ආඛ්‍යාත නොවන්නාවූ සියලු පද නිපාත' යැයි පවසයි. නිපාත පද ස්වාධීන වූ පද හෙයින් බොහෝ විට යෙදෙන්නේ වෙන්වවයි. ('ත්' යන්න හලන්ත තනි අක්ෂරයක් හෙයින් බොහෝවිට ඊට මුලින් ඇති පදය සමග එකට ලියැවේ). මෙබඳු ස්වභාවයෙන් යුතු නිපාතවල ලක්ෂණ කීපයකි.

එනම්,

1. ලිංග, විභක්ති හා වචන හේතුවෙන් වෙනසකට පත් නොවීම
2. වාක්‍යයක මුල, මැද හෝ අග යන තුන් තැන ම යෙදීම
3. වර නොනැඟීම
4. විවිධ අර්ථ ප්‍රකාශ කිරීම

### නිපාත වර්ගඃ-

සිංහල භාෂාවෙහි නිපාත රැසක් පවත්නා අතර ඒවායින් ප්‍රකාශ වන අර්ථය අනුව ද ඉගෙනීමේ පහසුව සඳහා ද ඒවා වර්ග කොට ඇත.

**කාලය හඟවන නිපාත :**

අද, සෙට, හෙට, ඊයේ, යළි, වැළි, නැවත, පැසුළු, ඉක්බිති, ඉනික්බිති, අනතුරු(ව), නිති, නිතර, නිබඳ, දූන්, ඉතින්, තව, නිතොර,

**අනියමාර්ථය හඟවන නිපාත :**

හෝ, නොහොත්

**හේත්වර්ථ නිපාත :**

අරභයා, අරබයා, නිසා, බැවින්, හෙයින්

**ගෞරවාර්ථ නිපාත :**

සේක, සේක්, දෑ

**අවධාරණාර්ථය හඟවන නිපාත :**

ම, නම්

**පිණිස යන අර්ථය හඟවන නිපාත :**

පිණිස, තකා, සඳහා, වස්

**වාක්‍ය සම්බන්ධය හඟවන නිපාත :**

යි, නම්, ද, ත්

**නිශ්චයාර්ථය හඟවන නිපාත :**

මිස, මුත්, හැර, පියා, විනා

**ආමන්ත්‍රණාර්ථය හඟවන නිපාත :**

එම්බා, එම්බල, බොල, කොල, බොලේ, ඒයි, ඕයි

**ප්‍රශ්නාර්ථය හඟවන නිපාත :**

කිම, කිම්, නො, නු, ඇයි, මන්ද, ද, මොකෝ, මොකද?

**ප්‍රමාණාර්ථය හඟවන නිපාත :**

විතර, මෙන්, වගේ, පමණ, තරම්

**වාක්‍ය අවසානය හඟවන (සමාප්ත්‍යර්ථ) නිපාත :**

ය, හ, ඉ, යි, යැ

**ආශීර්වාදය හඟවන නිපාත :**

වා

**අවධාරණාර්ථය හඟවන නිපාත :**

ම, නම්

**උපන්‍යාසය/ මාතෘකාර්ථය හඟවන නිපාත :**

නම්, වනාහි, කලී, වූකලී, එනම්

**පර්යායාර්ථය (අනන්‍යාර්ථය) හඟවන නිපාත :**

හෙවත්

**ලක්ෂ්‍යාර්ථ/අවධාරණාර්ථය හඟවන නිපාත :**

අන්න, ඔන්න, මෙන්න

**විභක්ත්‍යර්ථය හඟවන නිපාත :**

විසින්, ගෙන්, නිසා, හට, පිණිස, වස්, ගේ, තුළ, මත, උඩ, කෙරෙන්, කෙරෙහි

**සමානාර්ථය හඟවන නිපාත :**

වගේ, සේ, මෙන්, ලෙස, බඳු, අයුරු, වැනි, එව්

**සීමාව හඟවන නිපාත :**

තෙක්, දක්වා, තුරු, පටන්, තාක්, කරා

**අනුමත්‍යර්ථ** : හා, ඔව්, එහෙයි, එහෙමයි, එසේයි

**ශීඝ්‍රාර්ථය හඟවන නිපාත** :

වහා, සෙද, නොලසා

**ලලනාර්ථ නිපාත** :

දෙයි - දෙයි, බයි - බයි

**භාව ප්‍රකාශන නිපාත** :

1. විස්මයාර්ථ :- හා, අහා, අඃ, ඔහේ අහෝ,
2. ඛේදර්ථ :- අනේ, අපෝ, අයියෝ, අඳෝ
3. වේදනාර්ථ :- ආයි, ඌයි, උඃ
4. කුත්සිතාර්ථ (පිළිකුල්) :- චී, චිඃ, සී සී, චිකේ

**ඇසූ බව හඟවන (ශ්‍රැති සූචනාර්ථ) නිපාත** :

ලු, ලූ

**උද්ධෘතාර්ථ නිපාත** :

යි, යැයි

**නිෂේධාර්ථ (නැත අර්ථ)** : නහමක්, නො

**ප්‍රතික්ෂේපාර්ථය** : එපා,

**සමඟ අර්ථය හඟවන (සහාර්ථ) නිපාත** :

සමඟ, එක්ක, කැටුව, හා, සහ, ඉහි

# උපසර්ග

උප + සර්ග යනු නාම ප්‍රකෘතියකට හෝ ධාතු ප්‍රකෘතියකට හෝ ළං වී අර්ථය වැළඳ ගන්නා වූ අව්‍යය ගණයට වැටෙන පද විශේෂයකි (උපසමීපෙ සෘජ්‍යතෙ උච්චාය්‍යීතෙ ක්‍රියා වාචකස්‍ය ශබ්දස්‍යෙති - උපසර්ගඃ). ඇතැම් වචනවල උපසර්ග එකකට වඩා යෙදෙන අවස්ථා ද පවතී. උපසර්ග තනි ව නො යෙදෙන අතර නිතර ම තවත් පදයක් සමඟ ඊට මුලින් යෙදේ. උපසර්ග මගින් ප්‍රකෘතියේ අර්ථය වෙනස් කිරීම, එම අර්ථය එලෙස ම පැවැත්වීම, එම අර්ථය වැඩි කිරීම යන කාර්ය සිදු වේ.

'ධාත්වර්ථං බාධතෙ කශ්චිත් - කශ්චිත් තමනුවර්තතෙ,
තමෙව විශිනශ්ටන්‍යඃ උපසර්ග ගතිස්ත්‍රිධා'

අතීතයේ උපසර්ග 'පද' වශයෙන් හැඳින්වූ අතර පදයක් නම් තනි ව ලිවිය හැක්කක් විය යුතු නිසා උපසර්ග එලෙස වෙන් ව ලිවිය නොහැකි බැවින් 'පද' වශයෙන් නොසැලකිය හැකි බව කුමාරතුංග මුනිදසයන්ගේ අදහසයි.

සිදත් සඟරාවේ දක්වෙන පරිදි උපසර්ග 20 කි. ඒවා නම්,

1. 'ප' - පබල, පවර, පබඳ, පසිඳු
2. 'පර' - පරදිනු, පරසිඳු, පරපද
3. 'අව' - අවමඟුල්, අවනඩු, අවමන්
4. 'ස' - සබඳ, සපුරන, සදහම්, සසිරි
5. 'අනු' - අනුනා, අනුමාන, අනුදත්, අනුමෝදනා, අනුසස්
6. 'නි' - නිදුක්, නිවහල්, නිසල, නිමල, නිකසල
7. 'දු' - දුසිරිත්, දුදන, දුබල, දුගඳ, දුගති
8. 'වි' - විදෙස්, විවාද, විසම, විමල, විසල්, විරති
9. 'අ' - අයැදුම, අයහපත්, අකුසල, අදිසි, අසිරි
10. 'අදි' - අදිපති, අදියර, අදිනා,
11. 'සු' - සුසුරිත්, සුපිහිටි, සුපිරි
12. 'උ' - උදුල්, උගෙන, උමග
13. 'අබි' - අබිමන්, අබිසරු, අබිදම්, අබිමුව,
14. 'පිරි' - පිරිසුදු, පිරිනිවන, පිරිහුණු
15. 'උප' - උපවන, උපදෙස්, උපනායක
16. 'අප' - අපවාද, අපහස්, අපදන්
17. 'පස්' - පසැස්, පසක්, පස්විකුම්
18. 'පිළි' - පිළිතුරු, පිළියම්, පිළිගනී, පිළිසකර
19. 'අති' - අතිරස, අතිමහත්, අතිසය, අති
20. 'පි' - පිහිකුළු, පියන්, පියන

මීට අමතර ව යෙදෙන උපසර්ග කීපයකි.

එනම්,

1. 'ඔ' - ඔවා, ඔවදන්
2. 'කු' - කුකවි, කුදිටු
3. 'ඉ' - ඉමහත්, ඉපැරණි

සංස්කෘත භාෂාවේ ආභාසයෙන් මිශ්‍ර සිංහලයෙහි එන උපසර්ග

1. 'අති' - අතිධාවන, අතිවිශේෂ, අතිගම්භීර, අතික්‍රම, අත්‍යවශ්‍ය
2. 'අධි' - අධිමාන, අධිපති, අධිරාජ්‍ය, අධිකාර, ආධ්‍යාත්මික
3. 'අනු' - අනුරූප, අනුවාද, අනුස්මරණ, අන්වර්ථ
4. 'අපි' - අපිධාන(පියන), අපිජිහ්විකා, අපිච්ඡද
5. 'අභි' - අභිධර්ම, අභිශේක, අභියෝග, අභිමාන, අභිවාදන, අභ්‍යුත්පන්න
6. 'අව' - අවමංගල, අවමාන, අවශේෂ, අවවාද, අවබෝධ, අවලෝකන
7. 'ආ' - ආවේග, ආදේශ, ආදර්ශ, ආයාත, ආධාර, ආනයන
8. 'උත්' - උත්තුංග, උත්ප්‍රේක්ෂ, උත්කර්ෂ, උද්‍යෝග, උද්ඝෝෂණ, උන්මුඛ, උල්ලංඝන
9. 'උප' - උපදේශ, උපමාන, උපහාර, උපයෝග, උපවාස, උපවන
10. 'දුස්' - දුශ්ශීල, දුෂ්කර, දුස්සාධ්‍ය, දුස්සමාහිත, දුෂ්ප්‍රතිපත්ති, දුෂ්පෝෂණ, දුස්ස්‍රාවිතාව
11. 'නි' - නිවාස, නිරෝග, නියෝග, නිග්‍රහ, නිබන්ධ
12. 'නිස්' - නිශ්චල, නිශ්ශබ්ද, නිෂ්කාරණ, නිෂ්පාදන, නිස්සාර, නිස්සරණ
13. 'පරා' - පරාජය, පරාක්‍රම, පරාධීන, පරාභව, පරාමර්ශ
14. 'පරි' - පරිවර්තන, පරිගණක, පරිශීලන, පරිශුද්ධ
15. 'ප්‍රති' - ප්‍රතිගාමී, ප්‍රතිබද්ධ, ප්‍රතිජීවක, ප්‍රතික්‍රියා, ප්‍රතිඵල
16. 'ප්‍ර' - ප්‍රබල, ප්‍රවාද, ප්‍රමාද, ප්‍රවේග, ප්‍රවර්ධන, ප්‍රමාණ
17. 'වි' - විශේෂ, විරෝධ, විමුක්ත, වියෝග, විප්‍රයෝග, විලෝකන
18. 'සම්' - සම්භෝග, සම්බන්ධ, සම්පූර්ණ, සම්භාව්‍ය, සම්පත්ති
19. 'අප' - අපවාද, අපද්‍රව්‍ය, අපකීර්ති, අපයෝජන, අපකර්ශන, අපනයන, අපහරණ
20. 'සු' - සුචරිත, සුප්‍රසිද්ධ, සුදර, සුගුණ, සුගන්ධ
21. 'නිර්' - නිර්වාණ, නිර්යාත, නිර්ගුණ, නිර්දිෂ්ට, නිර්ගන්ධ, නිර්දෝෂ
22. 'නී' - නීරෝග, නීරස, නීහරණ (දුරු කිරීම), නීරක්ත
23. 'දුර්' - දුර්ගන්ධ, දුර්ජන, දුර්වල, දුර්විනීත, දුර්භාග්‍ය, දුර්වල/දුර්බල

**උපසර්ග එකට වඩා යෙදෙන අවස්ථා :**

සුවිශේෂ, අතිවිශේෂ, සෝපාහාස, සුනිමල, සුසුවඳ, අත්‍යුත්කෘෂ්ට, සුපිරිසුදු, අනභිමුඛ, අනතිමාන, අනවබෝධ, අපිරිසිදු, අත්‍යුදර, අතිප්‍රසිද්ධ, අධ්‍යාහාර, දුර්විනීත, අනවධානය, අනභිභවනීය, අතිසම්භාවනා, සාතිශය, ව්‍යවහාර, දුෂ්ප්‍රතිපත්ති, අනිර්වචනීය, ප්‍රතිවිරුද්ධ, සුවිශුද්ධ, සුපරීක්ෂාකාරී